කිසිවකුට එබඳු දහමක මග පෙන්වීමට විරුද්ධ විය නොහැකිය.

සැබවින් ම රාජ්‍යයක සියළු පුරවැසියන් සමානත්වයෙන් සළකා සැමගේ අයිතිවාසිකම් සපුරමින් ඔවුනට නිවැරදිව හිතසුව සැලසීම සඳහා මග පෙන්විය හැකි ප්‍රතිපත්ති මූලාශ්‍රයක් පැවතිය යුතුය. රාජ්‍යව්‍යවස්ථාවෙහි ප්‍රතිපත්ති සකස් විය යුත්තේ ඒ ප්‍රතිපත්ති මූලාශ්‍රයට අනුවය. මනුෂ්‍යත්වය හා එහි නිවැරදි සුවපත් බව පමණක් අරමුණු කරගත් චින්තනයකින් ඉදිරිපත් වන ප්‍රතිපත්ති සමුදායක් බුදුදහමින් හැර වෙනත් කිසිදු ආගමකින් හෝ දර්ශනයකින් මෙතෙක් ප්‍රකාශ වී නොමැති බව බුදුදහම මනාව හදාරා ඇති කවුරුත් අවිවාදයෙන් පිළිගනිති.

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අදාළ වන බුදුදහමේ මගපෙන්වීම් මදක් විමසා බැලීම මෙහිදී වැදගත් වෙයි. රාජ්‍යයක් පවත්වා ගතයුතු ආකාරය බුදුදහමින් මනාව පැහැදිළි කොට ඇත්තේ චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය යටතේය. ඊට අනුව රාජ්‍යයක මූලිකම ප්‍රතිපත්තිය වියයුත්තේ ධර්මයයි. රාජ්‍යයක ධර්මයට දියයුතු තැන චක්කවත්ති සීහනාද සූත්‍රයේදී අවධාරණය වන්නේ "ධර්මයෙහි පිහිටා, ධර්මයට සළකමින්, ධර්මය ගරු කරමින්, ධර්මයෙහි ආධිපත්‍යය පිළිගනිමින්" ආදිවශයෙනි. මෙහි ධර්මය යනු බුදුදහම නොවේ. ඒ වූ කලි සමාජ සුරක්ෂිතතාවේ, සමාජසාධාරණත්වයේ, සදාචාරයේ හා යුක්ති ධර්මයේ මූලාශ්‍රයයි. අගතීන්ගෙන් තොරව අපක්ෂපාතීව ක්‍රියාකිරීම ධර්මයෙහි පිහිටීම ලෙස සිගාලොවාද සූත්‍රයෙහි දැක්වෙයි,



රාජ්‍යතන්ත්‍රයේ සියළු ක්‍රියාකාරකම්වල මග පෙන්වන්නා ධර්මය ලෙස පිළිගැනෙන්නේ නම් සමාජය කිසිදු වර්ග භෙදයකට ලක් නොවෙයි. සැමට සමානව සැළකීම ධර්මයයි. රටතුළ කිසිදු තැනක අයුක්තියක් අසාධාරණයක් නොවියයුතු බවට චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් උපදෙස් දී තිබේ.

මානව සමාජයේ පොදු සුභසිද්ධියට අදාළ වන රාජධර්ම හා සමාජධර්ම බුදුදහම තුළ විවිධාකාරයෙන් විග්‍රහ කොට තිබේ. අනුන් ද තමාට සමාන කොට සැළකීමේ (අත්තූපනායික) මූලධර්මය බුදුදහමින් තරම් අන් කිසිදු ආගමකින් ඉස්මතු කොට නැත. බුදුදහමෙහි සමානාත්මතා ධර්මය ලෙස සැළකෙන්නේ ද මෙයයි. අනුන්ගේ සැපදුක් වෙදනා හා හැඟීම් තමාගේ සැපදුක් වෙදනා හා හැඟීම්වලට සමාන කොට සැළකෙන සමාජ රටාවක සාමය සමගිය සංහිඳියාව අනිවාර්ය ප්‍රතිඵල වෙයි. මෙහිදී කුලභෙද, ජාතිභෙද, වර්ණභෙද, ආගම්භෙද වැනි සියළු භෙද භින්නතා අප්‍රධාන වෙයි.

සමාජ සුරක්ෂිතතාවේ මූලධර්මය ද සමානාත්මතා ධර්මයයි. එහිදී සැමගේ අයිතිවාසිකම් සමානව සුරැකීම, මානවහිමිකම් ප්‍රවර්ධනය, සැමට රැකියා අවස්ථා සැලසීම, අධ්‍යාපන හා සෞඛ්‍යය වැනි වරප්‍රසාද කිසිදු භෙදයකින් තොරව සැපයීම, සැමට බියෙන් සැකෙන් තොරව ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම වැනි රාජ්‍ය වගකීම් ඉටු කිරීම අවධාරණය වෙයි.

සම්පූර්ණයෙන් ම ලෞකික ක්ෂෙත්‍රයක් වන ආර්ථික අංශයෙහි ධාර්මික සමෘද්ධිය කෙරෙහි බුදුදහම අවධානය යොමු කොට ඇත්තේ ද දිළිඳුබවින් තොර සුඛිත මුදිත බව පුද්ගල ජීවිතයට අත්‍යවශ්‍ය වන බැවිනි. පෞද්ගලික හා රාජ්‍ය අංශයන් මගින් ක්‍රියාත්මක කළයුතු නිෂ්පාදනය, බෙදාහැරීම හා පරිභොජනය යනුවෙන් එන ආර්ථිකයේ ප්‍රධාන අංශවලට අදාළව ඉදිරිපත්වන ආර්ථික ප්‍රතිපත්ති බෞද්ධ ජනතාවක් පමණක් අරමුණු කර ගත් ඒවා නොවේ. පොදු සමස්ත ජනතාවගේ සුභසිද්ධිය ඒවායේ ඒකායන අරමුණයි.

රාජ්‍යතන්ත්‍රයක පැවතියයුතු හැම අංශයක් ම ආවරණය කරගත හැකි පරිදදෙන් භෞතික හා ආධ්‍යාත්මික යන අංශ දෙකේ ම ප්‍රගතිය අවධාරණය කරන බුදුදහම තරම් රාජ්‍ය ව්‍යවස්ථාවකට පරමාදර්ශය කරගත හැකි වෙනත් කිසිවක් නැත. එබැවින් ව්‍යවස්ථාගතව බුදුදහම රටක රාජ්‍ය ආගම වීම යනු ඒ රටේ සමස්ත ජනතාවට ම ආශීර්වාදයකි.

බුදුදහම ලංකාවේ රාජ්‍ය ආගම ලෙස ව්‍යවස්ථාගත විය යුතුයයි අප යෝජනා කරන්නේ බුදුදහමට වැඳුම් පිදුම් පැවැත්වීමක් සඳහා නොවේ. එය ලංකාවේ බහුතර ජනතාවගේ ආගම වන නිසා ද නොවේ. එය සිංහල බෞද්ධයන්ගේ අභිමානයට හේතුවක් වන නිසා ද නොවේ. අනෙක් ආගම් බුදුදහමට වඩා පහත් තත්වයෙන් තබා ගැනීමේ ආකල්පයෙන් ද නොවේ. රාජ්‍යපාලකයන්ට මානව දයාවෙන් යුතුව රාජ්‍ය කටයුතු නියාමනය කරගැනීමට මාර්ගදර්ශකයක් කරගැනීම සඳහා පමණි. බුද්ධශාසනය ආරක්ෂා කොට පෝෂණය කිරීම තුළ වෙහෙර විහාර ඉදිවනු දැකිය හැකිය. ගිනස් වාර්තා තැබිය හැකි තොරන් අහස උසට ගොඩ නැගෙනු දැකිය හැකිය. දළදා පෙරහැර හා දේවාල පෙරහැර සැතපුම් ගණන් දිගට විහිදෙනු දැකිය හැකිය. දහස් ගණන් කුලපුතුන් පැවිදිව කසාවතින් බැබලෙනු දැකිය හැකිය. එහෙත්, ඒ නිසා ම මනුෂ්‍යත්වය අගය කරන, යුක්තිය හා සාධාරණය ගරු කරන, මානව අයිතිවාසිකම් සුරකින, දුරාචාරය දූෂණය සොරකම අල්ලස පිටුදකින, සාමකාමී සහජීවන සමාජ පරිසරයක් ගොඩනැගෙනු දැකිය හැකිද? බුදුදහම රාජ්‍යප්‍රතිපත්ති මූලාශ්‍රය වශයෙන් ගෙන ඉහල ම රාජ්‍යනායකයාගේ සිට සමස්ත රාජ්‍ය තන්ත්‍රය ම ධර්මාධිපත්‍යයෙහි පිහිටා ක්‍රියා කරන්නේ නම් යථොක්ත පුරුෂාර්ථ සාධනය කර ගැනීම හුදු සිහිනයක් නොවනු ඇත. බුදුසසුනට ව්‍යවස්ථාවෙන් ප්‍රමුඛත්වය දී ලබා ගෙන ඇති ප්‍රතිඵල අපි සැහෙන කාලයක් අත්දැක ඇත්තෙමු. එහෙත්, රටේත් ජනතාවගේත් භෞතික හා ආධ්‍යාත්මික සුභසිද්ධිය පිළිබඳව තවමත් අපි සිහින දකිමු. එබැවින් බුදුදහමට ක්‍රියාකාරී ප්‍රමුඛත්වය දෙමින් එය රාජ්‍යයේ නියාමක බලවේගය කරගැනීමේ අවශ්‍යතාව යුගයේ අවශ්‍යතාව කොට සැළකිය යුතුව තිබේ.

